# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 158/8 — 1975 අප්‍රේල් 10 වැනි බ්‍රහස්පතින්ද — 1975.04.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—ඕ. 31/71.

### 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත

1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ 12 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1975 සිමාසහිත ඔටෝමොබයිල් ඇසම්බ්ලි ඇන්ඩ් මැනුපැක්චර් (වත්කම් හා බැරකම්) නියෝග යනුවෙන් හඳුන් වනු ලැබේ.

2. (1) නිශ්චිත ව්‍යාපාරයේ වත්කම් හා බැරකම් පිළිබඳව පරීක්ෂා කොට තමා වෙත වාර්තා කිරීම සඳහා, මුදල් අමාත්‍යවරයා විසින් කමිටුවක් පිහිටුවමින් තුන් දෙනෙකුට නො අඩු තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිල නාමින් ඒ සඳහා පත්කරනු ලැබිය හැකිය.

(2) (1) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ තැනැත්තන් අතුරින් එක් තැනැත්තකු කමිටුවේ සභාපති ලෙස මුදල් අමාත්‍යවරයා විසින් නම් කළ හැකිය.

3. නිශ්චිත ව්‍යාපාරයට මුදල් ණය හෝ එම ව්‍යාපාරයෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ හිමිකමක් ඇති යම් තැනැත්තකු විසින් එම ණය හෝ හිමිකම පිළිබඳව පුවත්පතේ නිශ්චිත දිනකට පෙර කමිටුව වෙත දන්වන ලෙස නියම කරමින් ප්‍රවෘත්ති පත්‍රයක හෝ ඊට වැඩි ගණනක හෝ දැන්වීමක් පළකිරීම හෝ පළ කිරීමට සැලැස්වීම කමිටුව විසින් කළ හැකිය.

4. ආණ්ඩුව වෙත සතු කරන ලද නිශ්චිත ව්‍යාපාරයේ හා ඒ ව්‍යාපාරයේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත සතු කරන ලද දේපළේ සාධාරණ වටිනාකම නිශ්චිත ලෙස දැනගැනීම සඳහා අවශ්‍ය වන සියළුම පියවර කමිටුව විසින් ගත යුතු ය.

5. (1) නිශ්චිත ව්‍යාපාරය පිළිබඳ වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා, ව්‍යාපාර කොටස් වල, ඉඩම්වල, ආයෝජනවල හා අනිකුත් ස්වෑර්ථවල සම වටිනාකම, උපයන ලද ලාභ, වෙළෙඳ පොළේ තත්ත්වය හා වෙනත් කරුණු ආදියට යටත්ව, කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකිය.

(2) නිශ්චිත ව්‍යාපාරයෙහි යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ ද ඇතුළුව, දේපළෙහි වටිනාකම් තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා, කමිටුව විසින් ගැනුම් මිළ හෝ එම දේපළ මිළයට ගත් අවස්ථාවේ පැවති වෙළෙඳ මිළ සැලකිල්ලට ගනු ලැබිය හැකි අතර අගයක්ෂය, වෙළෙඳ පොළේ තත්ත්වයන් හා වෙනත් කරුණු අනුව සාධාරණ යයි පෙනී යන යම් මුදලක් ඉන් අඩු කළ හැකිය.

(3) නිශ්චිත ව්‍යාපාරයේ බැරකම් තක්සේරු කිරීමේ කාර්යය සඳහා, වෙනත් කරුණු අතර ඉටු කළ යුතු යම් ගිවිසුම් බැඳීමක් හෝ වෙනත් නීත්‍යනුකූල බැඳීමක් පිළිගත් මුදල් හෝ වාණිජ ආයතන සමඟ හෝ නිශ්චිත ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හැර වෙනත් තැනැත්තන් සමග ඇති කරගත් නිර්ව්‍යාජ ගනුදෙනු, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, වෙනත් රජයේ ආයතනයකට කළ යුතු ගෙවීම් සහ නිශ්චිත ව්‍යාපාරයේ කටයුතු නිසා යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාවක් විසින් දරන ලද පාඩු කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකිය.

6. කමිටුව විසින් කලින් කල අවශ්‍ය කරනු ලැබිය හැකි සියළුම විස්තර හා තොරතුරු නියම බලධරයා විසින් සැපයිය යුතු අතර කමිටුවේ කටයුතු පහසු කිරීමට අවශ්‍ය සහාය ද දිය යුතු ය.

7. කමිටුව විසින්, නිශ්චිත ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවීම් තිබේ නම්, ඒ ගෙවීම් පිළිබඳ සහ එකී ගෙවීම් කළ යුත්තේ යම් පාර්ශ්වයකට ද නැතහොත් පාර්ශ්වයන්ට ද ඒ පාර්ශ්වය හෝ පාර්ශ්වයන් පිළිබඳ තම නිර්දේශ ද සහිතව, නිශ්චිත ව්‍යාපාරයේ වත්කම් සහ බැරකම් පිළිබඳව මුදල් අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය. එම වාර්තාව ලැබුණු පසු, එවැනි ගෙවීමක් සම්බන්ධයෙන් සුදුසු යැයි තමා සලකන යම් නියමයක් මුදල් අමාත්‍යවරයා විසින් කළ හැකිය.

8. (1) ඉහත සඳහන් 7 වන නියෝගය යටතේ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී නියමයේ දින සිට දින 14 ක් ඇතුළත, අභියාචනය කිරීමට උත්සුක වූ හේතු ද සඳහන් කරමින්, මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය.

(2) 8 වන වගන්තියේ (1) වන ඡේදය යටතේ අභියාචනයක් ලැබුණු විට, 7 වන නියෝගය යටතේ කරන ලද නියමය ප්‍රතිශෝධනය කිරීම මුදල් අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, එසේ ප්‍රතිශෝධනය කරන ලද නියමය අවසානාත්මක හා තීරණාත්මක සහ අදාළ සියල්ලන් කෙරෙහි අනුගම්‍ය වන්නේය.

9. මුදල් අමාත්‍යවරයා විසින් කමිටුවේ සාමාජිකයින්ට යම් නිශ්චිත පාරිශ්‍රමිකයක් හෝ ගාස්තුවක් ගෙවීම නියම කරනු ලැබිය හැකි අතර එම පාරිශ්‍රමිකය හෝ ගාස්තුව නිශ්චිත ව්‍යාපාරයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

10. මෙම නියෝගවල කාර්යයන් සඳහා—

"නියම බලධරයා" යන්නෙන් නිශ්චිත ව්‍යාපාරයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද නියම බලධරයා අදහස් වේ;

"නිශ්චිත ව්‍යාපාරය" යන්නෙන් සීමාසහිත ඔටොමොබයිල් ඇසම්බ්ලි ඇන්ඩ් මැනුපැක්චර් යනුවෙන් නම් කරනු ලබන හා හඳුන්වනු ලබන සමාගම විසින් කර ගෙන යනු ලද්දා වූ ද, 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ සාදනු ලැබ, 1972 මාර්තු මස 8 වන දින අංක 15,000/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සතු කිරීමේ නියමයෙන් ආණ්ඩුව වෙත සතු කර ගන්නා ලද්දා වූ ද ව්‍යාපාරය අදහස් වේ.

4-342/1

---

එල්. ඩී.—බී. 31/71.

**1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත**

1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ 12 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 1975 සීමාසහිත යුනයිටඩ් මෝටර්ස් (වත්කම් හා බැරකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) නිශ්චිත ව්‍යාපාරයේ වත්කම් හා බැරකම් පිළිබඳව පරීක්ෂා කොට තමා වෙත වාර්තා කිරීම සඳහා, මුදල් අමාත්‍යවරයා විසින් කමිටුවක් පිහිටුවමින් තුන් දෙනෙකුට නො අඩු තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිල නාමින් ඒ සඳහා පත්කරනු ලැබිය හැකිය.

(2) (1) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ තැනැත්තන් අතුරින් එක් තැනැත්තකු කමිටුවේ සභාපති ලෙස මුදල් අමාත්‍යවරයා විසින් නම් කළ හැකිය.

3. නිශ්චිත ව්‍යාපාරයට මුදල් ණය හෝ එම ව්‍යාපාරයෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ හිමිකමක් ඇති යම් තැනැත්තකු විසින් එම ණය හෝ හිමිකම පිළිබඳව පුවත්පතේ නිශ්චිත දිනකට පෙර කමිටුව වෙත දන්වන ලෙස නියම කරමින් ප්‍රවෘත්ති පත්‍රයක හෝ ඊට වැඩි ගණනක හෝ දැන්වීමක් පළකිරීම හෝ පළ කිරීමට සැලැස්වීම කමිටුව විසින් කළ හැකිය.

4. ආණ්ඩුව වෙත සතු කරන ලද නිශ්චිත ව්‍යාපාරයේ හා ඒ ව්‍යාපාරයේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත සතු කරන ලද දේපළේ සාධාරණ වටිනාකම නිශ්චිත ලෙස දැනගැනීම සඳහා අවශ්‍ය වන සියළුම පියවර කමිටුව විසින් ගත යුතු ය.

5. (1) නිශ්චිත ව්‍යාපාරය පිළිබඳ වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා, ව්‍යාපාර කොටස් වල, ඉඩම්වල, ආයෝජනවල හා අනිකුත් ස්වාර්ථවල සම වටිනාකම, උපයන ලද ලාභ, වෙළෙඳ පොළේ තත්ත්වය හා වෙනත් කරුණු ආදියට යටත්ව, කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකිය.

(2) නිශ්චිත ව්‍යාපාරයෙහි යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ ද ඇතුළුව, දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා, කමිටුව විසින් ගැනුම් මිළ හෝ එම දේපළ මිළයට ගත් අවස්ථාවේ පැවති වෙළෙඳ මිළ සැලකිල්ලට ගනු ලැබිය හැකි අතර අගයක්ෂය, වෙළෙඳ පොළේ තත්ත්වයන් හා වෙනත් කරුණු අනුව සාධාරණ යයි පෙනී යන යම් මුදලක් ඉන් අඩු කළ හැකිය.

(3) නිශ්චිත ව්‍යාපාරයේ බැරකම් තක්සේරු කිරීමේ කාර්යය සඳහා, වෙනත් කරුණු අතර ඉටු කළ යුතු යම් ගිවිසුම් බැඳීමක් හෝ වෙනත් නීත්‍යනුකූල බැඳීමක් පිළිගත් මුදල් හෝ වාණිජ ආයතන සමඟ හෝ නිශ්චිත ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හැර වෙනත් තැනැත්තන් සමඟ ඇති කරගත් නිර්ව්‍යාජ ගනුදෙනු, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, වෙනත් රජයේ ආයතනයකට කළ යුතු ගෙවීම් සහ නිශ්චිත ව්‍යාපාරයේ කටයුතු නිසා යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාවක් විසින් දරන ලද පාඩු කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකිය.

6. කමිටුව විසින් කලින් කල අවශ්‍ය කරනු ලැබිය හැකි සියළුම විස්තර හා තොරතුරු නියම බලධරයා විසින් සැපයිය යුතු අතර කමිටුවේ කටයුතු පහසු කිරීමට අවශ්‍ය සහාය ද දිය යුතු ය.

7. කමිටුව විසින්, නිශ්චිත ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවීම් තිබේ නම්, ඒ ගෙවීම් පිළිබඳ සහ එකී ගෙවීම් කළ යුත්තේ යම් පාර්ශ්වයකට ද නැතහොත් පාර්ශ්වයන්ට ද ඒ පාර්ශ්වය හෝ පාර්ශ්වයන් පිළිබඳ තම නිර්දේශය ද සහිතව, නිශ්චිත ව්‍යාපාරයේ වත්කම් සහ බැරකම් පිළිබඳව මුදල් අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය. එම වාර්තාව ලැබුණු පසු, එවැනි යම් ගෙවීමක් සම්බන්ධයෙන් සුදුසු යැයි තමා සලකන යම් නියමයක් මුදල් අමාත්‍යවරයා විසින් කළ හැකිය.

8. (1) ඉහත සඳහන් 7 වන නියෝගය යටතේ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී නියමයේ දින සිට දින 14 ක් ඇතුළත, අභියාචනය කිරීමට උත්සුක වූ හේතු ද සඳහන් කරමින්, මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය.

(2) 8 වන වගන්තියේ (1) වන ඡේදය යටතේ අභියාචනයක් ලැබුණු විට, 7 වන නියෝගය යටතේ කරන ලද නියමය ප්‍රතිශෝධනය කිරීම මුදල් අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, එසේ ප්‍රතිශෝධනය කරන ලද නියමය අවසානාත්මක හා තීරණාත්මක සහ අදාළ සියල්ලන් කෙරෙහි අනුගම්‍ය වන්නේය.

9. මුදල් අමාත්‍යවරයා විසින් කමිටුවේ සාමාජිකයින්ට යම් නිශ්චිත පාරිශ්‍රමිකයක් හෝ ගාස්තුවක් ගෙවීම නියම කරනු ලැබිය හැකි අතර එම පාරිශ්‍රමිකය හෝ ගාස්තුව නිශ්චිත ව්‍යාපාරයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

10. මෙම නියෝගවල කාර්යයන් සඳහා—

"නියම බලධරයා" යන්නෙන් නිශ්චිත ව්‍යාපාරයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද නියම බලධරයා අදහස් වේ;

"නිශ්චිත ව්‍යාපාරය" යන්නෙන් සීමාසහිත යුනයිටඩ් මෝටර්ස් යනුවෙන් නම්කරනු ලබන හා හඳුන්වනු ලබන සමාගම් විසින් කර ගෙන යන ලද්දා වූ ද, 1971 අංක 35 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ සාදනු ලැබ, 1972 මාර්තු මස 8 වන දින අංක 15,000/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, සතු කිරීමේ නියමයෙන් ආණ්ඩුව වෙත සතු කර ගන්නා ලද්දා වූ ද ව්‍යාපාරය අදහස් වේ.

4-342/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී